**ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 44.06 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 32.39 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11.67 ක් හෙවත් සියයට 26.49 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 37.86 | 30.76 | 7.10 | 18.75 |
| මූලධන | 6.20 | 1.63 | 4.57 | 73.71 |
| **එකතුව** | **44.06** | **32.39** | **11.67** | **26.49** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 01201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1.67 | 0.92 | 0.90 | 1.24 | 6.00 | 2.22 |

**2.3 අග්‍රිම ගිණුම**

කොමිෂන් සභාව යටතේ වූ අංක 7002/0000/00/0256/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.173,824 ක් විය.

**2.4 තැන්පත් ගිණුම**

කොමිෂන් සභාව යටතේ වූ 6000/0000/00/0001/0100/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.37,500 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.275,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබුණි. පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යසාධනය ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2.2 අභ්‍යන්තර විගණනය

කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 3.2.3 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජුනි 9 දිනැති අංක ඩී.එම්.ඒ /2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට එක් වාරය බැගින් රැස්වීම් වාර 4 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී එක් කමිටු රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

### 3.2.4 කොමිෂන් සභා රැස්වීම් හා ස්ථාවර කමිටු

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ රැස්වීම් සහ ස්ථාවර කමිටුවේ රැස්විම් වාර 12 ක් බැගින් රැස්වීම් වාර 24 ක් පැවැත්විය යුතු වුවද, කොමිෂන් සභාවේ රැස්වීම් වාර එකක් පමණක් පවත්වා තිබුණි.

### 3.2.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාවේ කාර්යාලය විසින් එම වාර්තා 2016 ජුනි 27 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

### 3.4 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **සැලැසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා එකතුව රු.5,000,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර එහි මූල්‍ය හා භෞතික කාර්යසාධනය පහත පරිදි විය.

| | ක්‍රියාකාරකම | සලසා තිබුණු ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ළඟා නොවූ ඉලක්ක ගත තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| (i) | සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය | 1,000,000 | 182,504 | 817,495 | පර්යේෂණ වාර්තා 10 ක් ඉදිරිපත් කිරීම හා සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය ත්‍රෛයි භාෂාවෙන් ඉදිරිපත් කිරීම |
| (ii) | විශ්ව විද්‍යාල අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය | 750,000 | - | 750,000 | තාක්ෂණික යෝජනා 8 ක් ඉදිරිපත් කිරීම හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ත්‍රෛයි භාෂාවෙන් ප්‍රතිපත්ති ප්‍රකාශය එළි දැක්වීම |
| (iii) | තෘතියික හා වෘත්තිය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය | 750,000 | - | 750,000 | පර්යේෂණ වාර්තා 7 එළිදැක්වීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය ත්‍රෛයි භාෂාවෙන් ඉදිරිපත් කිරීම |
| (iv) | 3 වන වර්ගයේ පාසල් පිළිබඳ සමීක්ෂණය හා දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම ( 3 වන අදියර) | 800,000 | - | 800,000 | වාර්තා 9 ක් ඉදිරිපත් කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| (v) | ගුරුවරුන් බඳවා ගැනීම් සහ ස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීම අතර පරතරය හඳුනාගැනීම | 300,000 | - | 300,000 | අවසන් වාර්තාව පිළියෙල කර නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීම |
| (vi) | තාක්ෂණික හා වෘත්තීය පුහුණු පාඨමාලාවලට ඇතුලත්වීම සඳහා ස්ත්‍රී පුරුෂ භාවයේ බලපෑම පිළිබඳ අධ්‍යයන | 150,000 | - | 150,000 | අවසන් වාර්තාව පිළියෙල කර නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීම |
| (vii) | නවක උපාධිධාරීන්ගේ වෘත්තීය හා ප්‍රායෝගික සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය | 110,000 | - | 110,000 | අවසන් වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම |
| (viii) | ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | 140,000 | - | 140,000 | වාර්තා සැකසීම සඳහා කමිටු 9 ක් ස්ථාපිත කිරීම |
| (ix) | ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය | 1,000,000 | 488,357 | 511,643 | අනුමත නව තනතුරු සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම, නියමිත දින වකවානුවල කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම. |
| | | -------------- | ----------- | ------------ | |
| | **එකතුව** | **5,000,000** | **670,861** | **4,329,139** | |
| | | ======= | ====== | ====== | |

**3.5** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**-----------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 03 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 16 | 12 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 11 | 01 |
| | **එකතුව** | **37** | **31** | **06** |